**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාලය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

2003 ජුනි 02 දිනැති පිඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,052,909 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,445,221 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,392,312ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ගමන් වියදම් හා සැපයීම් හා පාරිභෝගික වියදම් හා සේවා වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය හා කර්තව්‍ය ඉටු කිරීම) පනතේ II කොටසේ 10 (1) හි දැක්වෙන කාර්යභාරයන් ඉටු කිරීමට අදාළ කාර්යයන් කිසිවක් මෙම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සිදු කිරීමට නොහැකි වී ඇත. තවද ආයතනයේ පැවැත්ම පිළිබඳව පැවති අවිනිශ්චිතතාවයත්, නියමිත කාර්ය මණ්ඩලය කලට වේලාවට බඳවාගැනීමට නොහැකි වීමත්, බඳවාගන්නා ලද ස්ථිර කාර්ය මණ්ඩලයෙන් කොටසක් සේවයෙන් ඉවත් වීමත් මෙම තත්ත්වයට හේතු විය. | ඉටුකිරීමට අපේක්ෂිත සියළුම කාර්යයන් ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතු බව. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ කාර්යාලයේ කාර්යයසාධන වාර්තාව අනුව අතුරුදහන් වුවන්ගේ ඥාතීන් විසින් අතුරු වාර්තා ලබා ගැනීම සඳහා ඉල්ලීම් 172 ක් ඉදිරිපත් කර තිබුණ ද වාර්තා නිකුත් කර තිබුණේ පවුල් 68 කට පමණි. තවද ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දිස්ත්‍රික්ක 24 කින් ලැබී තිබුණු පැමිණිලි 16140 කින් පැමිණිලි 9501 ක් වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පැවති අවම කාර්ය මණ්ඩලයක් යටතේ වුවද ප්‍රාදේශීය කාර්යාල වල මූලික පරීක්ෂණ 148ක් පවත්වා, දක්නට නොමැති බවට වූ සහතික නිකුත් කිරීම සඳහා වන අතුරු වාර්තා 68 ක ප්‍රමාණයක් 2020 වර්ෂයේදී නිකුත්කරන ලදී. | අවශ්‍ය ක්‍රියාමාර්ග නියමිත කාලපරිච්ඡේද තුළ ගතයුතු බව. |
| (ඇ) 2020 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුතු තථ්‍ය කාර්යය මණ්ඩලය 32 ක් වන අතර ඉන් 14 දෙනෙකු පළාත් කාර්යාල තුල සේවය කරනු ලබයි. ඉතිරි නිළධාරින් 18 දෙනෙකු වෙනුවෙන් මසකට රු. 1,864,802 ක් වැනි අධික කුලියක් ගෙවමින් ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණු අතර අවශ්‍යතාවය ඇගයීමකින් තොරව 2020 දෙසැම්බර් 31 දින වන විට රු. 35,089,545 ක් වටිනා කාර්යාල උපකරණ හා පරිගණක උපාංග මිලදී ගෙනද තිබුණි. තවද, ආයතනයේ කාර්යය මණ්ඩලය අනුව සැසඳීමේදී විදුලිය, ආරක්ෂක සේවා හා පිරිසිදුකිරීමේ සේවාවන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු. 9,723,655 ක අධික වියදමක් දරා තිබුණි. මේ අනුව 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන අයවැය චක්‍රලේඛයේ අවධාරණය කර ඇති රාජ්‍ය වියදම් කළමනාකරණය හා මූල්‍ය විනය පවත්වාගෙන යාමෙන් බැහැරවී ඇති බව නිරීක්ෂණය විය. | 2020/21 වර්ෂ වල නව බඳවාගැනීම් වලට සරිලන පරිදි අවශ්‍ය මිලදී ගැනීම් සිදු කර ඇත. නව බඳවා ගැනීම් සඳහා 2019 වර්ෂයේ පුවත්පත් දැන්වීම් පලකර, සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවාගැනීමේ මූලික කටයුතු සිදුකර තිබූ නමුත් 2020 වර්ෂයේ පැවති මහ මැතිවරණයත්, කොවිඩ් වසංගත තත්ත්වයත්, වෙනත් ප්‍රායෝගික හේතුන් නිසා අදාල බඳවාගැනීම් ප්‍රමාද කිරීමට සිදුවිය.<br>❖ ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල 4ක් විදුලිය, ආරක්ෂක සේවා හා පිරිසිදු කිරීම් සඳහා මෙම වියදම් දරා ඇත. | අයවැය චක්‍රලේඛයේ අවධාරණය කර ඇති රාජ්‍ය වියදම් කළමනාකරණය හා මූල්‍ය විනය පවත්වාගෙන යායුතු බව. |
| (ඇ) කාර්යාලය සඳහා නිලධාරීන් අනුයුක්ත කර සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා අතිකාල වෙනුවෙන් රු. 30,520,159 ක වියදමක් දරා තිබුණ ද, පනතේ දැක්වෙන කාර්යයන් ඉටුකර ගැනීම වෙනුවෙන් සැලසුම් සකස් කර ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් කාර්යාලය පිහිටුවීමෙන් සාක්ෂාත් කර ගැනීමට | ❖ ආයතනයේ පැවැත්ම පිළිබඳ තිබූ අවිනිශ්චිතතාවයත්, ඒ අනුව ස්ථිර කාර්ය මණ්ඩලය නියමිත වේලාවට බඳවා නොගැනීමත්, බඳවාගන්නා ලද ස්ථිර කාර්ය මණ්ඩලය පවතින අවිනිශ්චිතභාවය හේතුවෙන් සේවයෙන් ඉවත් වීමත් යන කරුණු හේතුවෙන් මෙම තත්ත්වය උදා විය. | පනතේ සඳහන් කාර්යයන් ඉටුකිරීමට කටයුතු කලයුතු බව. |

| | | | |
|---|---|---|---|
| | බලාපොරොත්තු වූ අරමුණු එනම් 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමේ පනතේ II කොටසේ 10 (ආ) වගන්තිය ප්‍රකාරව අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධ සිදුවීම් පිළිබඳ නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල බලධාරීන් වෙත නිර්දේශ සිදුකිරීම හා 10(ඇ) වගන්තිය ප්‍රකාරව පනතේ විධිවිධාන සලසා ඇති පරිදි අතුරුදහන් වූ තැනැත්තන් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් හා බැඳියා ආරක්ෂා කිරීම යන කරුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | ❖ කොමසාරිස්වරුන්ගේ උපදෙස් මත අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ දිස්ත්‍රික් ලේඛන පිළියෙළ කර ජනමාධ්‍ය මඟින් ඒවා නිකුත් කිරීමට කටයුතු කර ඇත. තවද අයදුම්පත් විශාල ප්‍රමාණයක් දමිළ භාෂාවෙන් යුක්ත වූ නිසා ලේඛන පිළියෙල කිරීම ප්‍රමාද විය. | |
| (ඉ) | අතුරුදහන් වුවන්ගේ පවුලකට රු. 6,000ක අතුරු සහනාධාරයක් ලබා දීමට 2019 සැප්තැම්බර් 10 දිනැති අංක අමප /19/2401/131/022 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් තීරණය කර තිබුණි. ඒ අනුව යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 39 දෙනෙකු වෙනුවෙන් රු. 1,993,180ක් හා මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 114 දෙනෙකු වෙනුවෙන් රු.5,568,200ක් වශයෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.7,561,380ක මුදලක් පැවති අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් දීමනා ලෙස ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුලදී දීමනා ගෙවීමට හිමිකම් ඇති ප්‍රතිලාභීන් හඳුනා ගැනීමට කාර්යාලය කටයුතු කර නොතිබුණි. | පැවති අවම කාර්ය මණ්ඩලයක් යටතේ වුවද ප්‍රාදේශීය කාර්යාල වල මූලික පරීක්ෂණ 148ක් පවත්වා, දක්නට නොමැති බවට වූ සහතික නිකුත් කිරීම සඳහා වන අතුරු වාර්තා 68 ක ප්‍රමාණයක් 2020 වර්ෂයේදී නිකුත්කරන ලදී. | දීමනා ගෙවීමට හිමිකම් ඇති ප්‍රතිලාභීන් හඳුනා ගැනීමට කටයුතු කල යුතු බව. |